

# ශාන්ත බෙනදික් තාපසාරාමය

## ඇඩිශම්, හපුතලේ, ශ්‍රී ලංකාව

1931 වසරේ ඉංග්‍රීසි ජාතික වතු කළමණාකරුවෙකු වු තොමස් ලිස්ටර් විල්යස් ශ්‍රීමතාණන් විසින් සම්පුර්ණ කළු ගලින් සාදන ලද මන්දිරය “ඇඩිෂම්” යනුවෙන් හැඳින්වේ.

නගරබද ශබ්දයන්ගෙන් හා ග්‍රීෂ්මයන්ගෙන් ගත සිත විඩාතිව සිටින්නන් සීතල කඳුකරයේ සුන්දරත්වය සොයා යන ගමනේදී නැරඹිය යුතුම ස්ථානයකි මේ මන්දිරය.

විශාල වෘක්ෂයන්ගෙන් ගහන වු වනාන්තරය මැදින් ගමන්කොට මනාව සකසන ලද මල්වත්තෙන් හා පළතුරු ගස් අතරින් ඇදී එන්නෙකුට මනස්කාන්ත කදුවැටි වලින් ආවරණය වු තේජවන්ත බලකොටුව දර්ශනය වේ.

බුරුම තේක්ක ලීයෙන් සෑදුන වහලයද වහලය උඩ ඇති වාතාශ්‍ර කවුළුද පෞරාණික ගෘහ භාන්ඩද, මාළිගය සාදා ඇති ගෘහ නිර්මාණ ශිල්පයද ඔබව මවිතයට පත්කරයි.

1961 දී මෙම මන්දිරය සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය විසින් මිලදී ගන්නා ලද්දේ පූජකවරය පතකා එන ආධුනිකයන් පුහුණු කරන ආධුනික තාපසාරාමයක් වශයෙනි ශුද්ධ වු බෙනදික් තුමන්ගේ ආදර්ශ පාඨය වන “යාච්ඥාව හා වැඩ කිරීම” මෙහි සිටිනා අය විසින් අනුගමනය කරනු ලබයි.

**මෙම ස්ථානය හා එහි පරිසරයද එහි සිටින්නවුන්ගේ නඩත්තුද ඔවුන් විසින්ම ඔවුන්ගේ නිෂ්පාදනයන් තුළින් හා ගේට්ටුවෙන් ඇතුල්වන ඔබගේ පරත්‍යාගයන්ද සොයාගත යුතුය.**

**මෙම තාපසාරාමය නැරඹීමට ඔබට අවසර ඇත්තේ සති අන්තයන්හිද (සෙනසුරාදා සහ ඉරිදා) පෝය දින සහ රජයේ නිවාඩු දිනයන්හී පෙ.ව 9 සිට ප.ව 4 දක්වා පමණය.** (මහ සිකුරාදා හා නත්තල් දින හැර)

**මෙම ස්ථානයට ඇතුල්වීමට සදහා අත්පත්‍රිකාවක් ලබාගන්නා මෙන් අපි ඉල්ලා සිටිමු. නමුත් එය තාපසාරාමය නැරඹීමට ප්‍රවේශපත්‍රයක් නොවන බවද කරුණාවෙන් සලකන්න.**

ශාන්ත බෙනදික් තාපසාරාමය

ඇඩිශම්, හපුතලේ, ශ්‍රී ලංකාව.